687

ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය

අධ්‍යාපන පීඨය

ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව

උපාධි වැඩසටහන- 3වන මට්ටම

අවසාන පරීක්ෂණය 2023/2024

**EPU3532- විෂයමාලා අධ්‍යයනය හා ප්‍රායෝගික වැඩ-භාෂා අධ්‍යයනය-සිංහල/දෙමළ/ඉංග්‍රීසි**

කාලය - පැය තුනයි. (03)

දිනය - 2025.05.25 වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා

---

1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ තෝරා ගනු ලබන ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.

## 01 - වන කොටස

01. "භාෂාව මිනිසා විසින්ම සොයා ගන්නා ලද විස්මයජනක උපකරණයකි." භාෂාවේ සුවිශේෂී ලක්ෂණ පහක් (05) ලියන්න.

02. භාෂාවේ ද්විරූපතාව යන්න උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න.

03. "සිංහල භාෂාවට විවිධ භාෂාවන්ගෙන් වචන පැමිණ එය පෝෂණය වී තිබේ."

    (I) ඔරලෝසු, අර්තාපල්, අල්මාරි යන වචන පැමිණ ඇත්තේ කුමන භාෂාවෙන් ද?

    (II) ඉංග්‍රීසි භාෂාවෙන් පැමිණි වචන තුනක් (03) ලියන්න.

04. භාෂාවේ චතුර්විධ කුසලතාවන් නම් කරන්න.

05. "භාෂාව සමාජානුයෝගී කාරකයකි." මෙම අදහස තහවුරු කිරීමට කරුණු තුනක් (03) ඉදිරිපත් කරන්න.

06. භාෂාවක් ඉගෙනීමේදී බලපානු ලබන පවුල හා සම්බන්ධ සාධක තුනක් සඳහන් කරන්න.එම සාධක තුන (03) භාෂාව ඉගෙනීමට බලපාන ආකාරය කෙටියෙන් දක්වන්න.

07. නිෂ්ක්‍රිය වාග්මාලව සහ සක්‍රීය වාග්මාලාව යන්න උදාහරණ ඉදිරිපත් කරමින් පැහැදිලි කරන්න.

08. පෙර පාසල් ගුරුවරයෙකු හෝ ප්‍රාථමික පාසල් ගුරුවරයෙකු විසින් දරුවන්ගේ කතා කිරීමේ කුසලතාව සංවර්ධනය සඳහා අනුගමනය කළ හැකි ක්‍රම පහක් (05) සඳහන් කරන්න.

ලකුණු 05 X 08 =40



19

09. I. අවධානයෙන් සවන්දීම, අවබෝධයෙන් සවන්දීම සහ වින්දනාත්මකව සවන්දීම යන සවන්දීමේ ක්ෂේත්‍ර තුන (03) සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. එම එක් එක් ක්ෂේත්‍ර සංවර්ධනය කිරීම සඳහා පළමුවන ප්‍රධාන අවධියේ ගුරුවරයෙකු ලෙස සංවිධානය කරන ක්‍රියාකාරකම් දෙක (02) බැගින් ලියා දක්වන්න. (ලකුණු 10 )

10. I. "දරුවෙකුගේ භාෂා කුසලතාවන් සංවර්ධනය සඳහා තමන් හැදෙන වැඩෙන පවුල සුවිශේෂී දායකත්වයක් සපයයි." මෙම අදහස උදාහරණ සහිතව සාධාරණීකරණය කරන්න.

(ලකුණු 10 )

II. පෙර පාසල් ගුරුවරයෙකු ලෙස දරුවන්ගේ පෙර කියවීමේ කුසලතා සංවර්ධනයට සංවිධානය කරන ක්‍රියාකාරකම් පහක් (05) කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 10 )

11. I. දරුවෙකුට භාෂාව ඉගෙනීමේ දී ගුවන් විදුලිය, රූපවාහිනිය සහ පරිගණකය ඉටු කරන කාර්යභාරය පැහැදිලි කරන්න.

(ලකුණු 08 )

II. සාර්ථක ගුරුවරයෙක් දරුවන්ගේ භාෂා කුසලතාවන් සංවර්ධනය සඳහා ඵලදායී ලෙස මාධ්‍යය යොදා ගත යුතු ආකාරය පිළිබඳ ව විමර්ශනයක් කරන්න. (ලකුණු 12 )

12. I. "භාෂා කුසලතා සංවර්ධනය සඳහා දරුවන් තුළ සවන්දීමේ කුසලතා සංවර්ධනය වීම අත්‍යාවශ්‍ය ය." දරුවන් තුළ සවන් දීමේ කුසලතා සංවර්ධනය නොවීම නිසා ගුරුවරුන් මුහුණ දෙන ගැටලු පහක් (05) සාකච්ඡා කරන්න. (ලකුණු 10 )

II. පෙර පාසල්වල / ප්‍රාථමික පාසල්වල දරුවන්ගේ ශ්‍රවණ කුසලතා වර්ධනය කිරීම සඳහා ගුරුවරයෙකුට සංවිධානය කළ හැකි ක්‍රියාකාරකම් පහක් (05) උදාහරණ සහිතව පැහැදිලි කරන්න. (ලකුණු 10 )

13. I. පෙර පාසල් සමයේදී සහ ප්‍රාථමික පාසල් සමයේ දී දරුවන් මුහුණ දෙන භාෂා දුෂ්කරතා පහ (05) බැගින් ලියා දක්වන්න. (ලකුණු 10 )

II. අධ්‍යාපන මනෝවිද්‍යාව දන්නා ගුරුවරයෙකු ලෙස ඔබ එම භාෂා දුෂ්කරතා මගහැරවීමට කටයුතු කරන ආකාරය පියවර වශයෙන් ඉදිරිපත් කරන්න. (ලකුණු 10 )

*-සියලුම හිමිකම් ඇවිරිණි.-*



21